**නීලන් තිරුචෙල්වම් ට්‍රස්ට්**

**ව්‍යාපෘති යෝජනා සඳහා කැඳවීම**
**"අවදානමට ලක්වූ ප්‍රජාවන් බලගැන්වීම"**
**කැඳවුම් අංක: NTT/NOV/2017/02**

නීලන් තිරුචෙල්වම් ට්‍රස්ට් එහි 2017 නොවැම්බර් මූලයාධාර චක්‍රය වන "අවදානමට ලක්වූ ප්‍රජාවන් බලගැන්වීම" යටතේ සහයෝගය දැක්වීම සඳහා ව්‍යාපෘති යෝජනා දැන් භාර ගනු ලබන බව සතුටින් දන්වා සිටියි. **කැඳවුම් අංක: NTT/NOV/2017/02**

## පසුබිම

නීලන් තිරුචෙල්වම් ට්‍රස්ට් යනු සමාජ සාධාරණත්වය, සාමය සහ සංහිඳියාවෙහි මුලපිරීම් වලට සහයෝගය ලබාදෙන මහජන හිතෛෂී සංවිධානයකි. එය ශ්‍රී ලාංකීය නීති සම්පාදකයෙකු, ව්‍යවස්ථා විද්වතෙකු, සාම දූතයෙකු සහ ආයතන නිර්මාතෘ වරයෙකු මෙන්ම, අවිහිංසා ක්‍රම හරහා සාමය ගොඩ නැගීමට සක්‍රීයව කටයුතු කළ, ආචාර්ය නීලන් තිරුචෙල්වම් මහතාගේ ඝාතනයෙන් පසු 2001 වසරේදී පිහිටුවන ලදී. මෙම සංවිධානය එහි ආරම්භයේ පටන්ම, මානව හිමිකම් සුරැකීම, විනිවිදභාවය සහ වගවීම පහසුකරණය කෙරෙහි දායක වෙමින් සහ බහුත්ව වාදය, විවිධත්වය සහ ජනවාර්ගික සමගිය ප්‍රවර්ධනය කරමින්, ඔහුගේ උරුමය පතුරුවාලීමට සහ නොනැසී පවත්වාගෙන යාමට උත්සාහ දරමින් සිටියි. මෙම අරමුණුත් සමඟ, මෙම සංවිධානය (NTT) මූල්‍යාධාර සැපයීම සහ දිවයින පුරා සිවිල් සමාජ සංවිධානවල ධාරිතාව ශක්තිමත් කිරීම සිදුකරයි. සාමය ගොඩනැගීමේ සන්නායකයක් ලෙස කලාවට සහ සංස්කෘතියට සහයෝගය දක්වන්නෙක් ලෙස දිගු කාලයක් තිස්සේ පවතින කීර්ති නාමයක් ද NTT සතුව ඇත.

## ව්‍යාපෘති යෝජනා කැඳවීමේ අරමුණු

මෙම ව්‍යාපෘති යෝජනා කැඳවීම පුද්ගලයින් ලෙස සහ සාමූහිකව සංවර්ධන වීමට සිවිල් සමාජය සහ ප්‍රජා ප්‍රයත්නයන් ශක්තිමත් කිරීමට විශේෂයෙන් අපේක්ෂා කරයි; පාලනය සහ ප්‍රතිපත්ති ගැටළු තුළ පුරවැසි සහභාගිත්වය බල ගැන්වීමට සහ පාර්ශවකරුවන් සමග, විශේෂයෙන් ප්‍රාදේශීය, පළාත් සහ ජාතික තලයන්හිදී රජය සමග එහි ප්‍රතිපත්ති සහ වැඩ සටහන් ප්‍රජා අවශ්‍යතාවලට ඵලදායීව ප්‍රතිචාර දක්වන බව සහතික කිරීමට ඵලදායී ගණුදෙනුවක් කෙරෙහි බලාත්මක කිරීමට අපේක්ෂා කරයි.

## ව්‍යාපෘති වර්ග

හැකි අවස්ථාවලදී, පහත දැක්වෙන වැඩ සටහන් ක්ෂේත්‍ර හරහා බලපෑම සහතික කිරීමට අන්තර්ආංශික ප්‍රවේශයන් යෝජනා කරන ලෙස අයැදුම්කරුවන්ට අනුබල දේ. සහයෝගය ලබාදිය හැකි ව්‍යාපෘති/ක්‍රියාකාරකම් වර්ග වලට පහත සඳහන් ඒවා ඇතුළත් වන **නමුත් ඒවාට සීමාවී නැත**:

**වැඩ සටහන් ක්ෂේත්‍රය 1 : ඇතුළත් කෙරෙන ආර්ථිකයන් (පරිපූර්ණ ආර්ථිකයන්)**

a) පශ්චාත්-යුද්ධ නැවත ගොඩනැගීමේ සහ පුනරුත්ථාපන මුලපිරීම් තුළ සමාජ-ආර්ථික බලගැන්වීම ප්‍රවර්ධනය කිරීම;
b) ආර්ථික සම්පත්, ඉඩම් ඇතුළුව, කෙරෙහි ඇති අයිතීන් - හෝ එහි ප්‍රතික්ෂේප වීම් - පිළිබඳ ප්‍රලේඛනය, කතිකාව, උද්දේශනය, සහ පර්යේෂණවලට සහයෝගය දැක්වීම;
c) ප්‍රාදේශීය/කොන් කිරීමට ලක්වූ ප්‍රජාවන් සඳහා පරිපූර්ණ සහ ප්‍රවේශ විය හැකි වෙළඳපොළ, අගය සහ සැපයුම් දාමයන් සඳහා සහයෝගය දැක්වීම සහ ප්‍රාදේශීය/කොන් කිරීමට ලක්වූ ප්‍රජාවන් සඳහා ආර්ථික අවස්ථා ව්‍යාප්ත කිරීම;
d) ජීවනෝපායය සහාය, වෘත්තීය පුහුණු, ක්ෂුද්‍ර ණය යන ක්ෂේත්‍ර තුළ පවතින ප්‍රතිපත්ති, ක්‍රමවේදයන් සහ වැඩ සටහන් ඇගැයීම;
e) ප්‍රජාවන් ආර්ථික බලගැන්වීමෙහි නිරත වී සිටින සිවිල් සමාජ සංවිධාන ශක්තිමත් කිරීම.

**වැඩ සටහන් ක්ෂේත්‍රය 2 : ස්ත්‍රී පුරුෂ සමාජභාවය ප්‍රධාන ප්‍රවාහයට ගැනීම**

a) කාන්තාවන් සඳහා සම අවස්ථා වළක්වා ලන ව්‍යුහාත්මක සහ පද්ධතිමය සාධක ආමන්ත්‍රණය කිරීම; වෙනස් ප්‍රතිපත්තිවල අන්තර්ගතයට ස්ත්‍රී පුරුෂ සමාජභාවයේ දෘෂ්ටිකෝණය ඒකාබද්ධ කිරීමට කේවල් කරන මුලපිරීම්වලට සහයෝගය දැක්වීම සහ පශ්චාත් යුද පුනරුත්ථාපනයට සම්බන්ධ සහභාගිත්ව ගැටළු ආමන්ත්‍රණය කිරීම;

b) ස්ත්‍රී පුරුෂ සමාජ භාවය පදාක කරගත් ප්‍රචණ්ඩත්වය ආමන්ත්‍රණය කරන සේවා සැපයුම, උද්දේශනය, කතිකාව සහ සහන ලබාදීමේ පද්ධති ශක්තිමත් කිරීම;

c) ප්‍රජාවන්ගේ ජීවිත වැඩිදියුණු කරන තීරණ ගැනීම් සහ ප්‍රායෝගික පියවරවලට සහයෝගය දැක්වීමේ අරමුණින්, සේවා නියුක්තිය (රැකියා), ඉඩම්, සම්පත්, ආදියට කාන්තාවන්ගේ අයිතීන් පිළිබඳ කතිකාව, උද්දේශනය, සහ පර්යේෂණ සඳහා සහයෝගය දැක්වීම.

d) ප්‍රජාව සහ මහජන ජිවිතය තුළ නායකත්වය සහ සහභාගිත්වය ශක්තිමත් කිරීමට කාන්තාවන් හට අවස්ථා ලබාදීම;

**වැඩ සටහන් ක්ෂේත්‍රය 3 : කොන්කිරීමට ලක්වූ ප්‍රජාවන්ගේ අයිතීන් ශක්තිමත් කිරීම**

a) සමානාත්මතාවය, සාධාරණත්වය, සහ සමාජ යුක්තිය ප්‍රවර්ධනය කිරීමේ අදහසින් සාර්ව-ක්ෂුද්‍ර ආර්ථික ප්‍රතිපත්ති වලට පවතින අධිපති ප්‍රවේශයන් විවේචනාත්මකව විග්‍රහ කරන ශාස්ත්‍රිය සහ ප්‍රතිපත්ති කතිකාව, උද්දේශනය සහ පර්යේෂණ වලට සහයෝගය දැක්වීම;

b) අයිතීන් අපයෝජනයට ලක් කෙරෙන උල්ලංඝන සහ ප්‍රජාවන්ගේ කතා වස්තු හඳුනාගැනීම සහ ලේඛන ගත කිරීම බලගැන්වෙන පද්ධති පිහිටුවීම සහ ශක්තිමත් කිරීම;

c) කොන් කිරීමට ලක්වූ/අවදානමට ලක්වූ ප්‍රජාවන් හට මනෝ සමාජයීය උපදේශනය ඇතුළුව, නෛතිකාධාර සහාය සහ සේවා වලට වඩාත් යහපත් ප්‍රවේශයක් පැවතීමට සහයෝගය ලබාදීම;

d) නාගරික සහ ග්‍රාමීය පෙදෙස් යන දෙකෙහිම මානව හිමිකම් සහ යුක්තිය, අදහස් ප්‍රකාශ කිරීමේ නිදහස, තොරතුරු වලට අයිතිය, සංක්‍රමික සේවකයින්, වතු සේවකයින් සහ පවුල් සහ අනෙකුත් කොන් කිරීමට ලක්වූ/අවදානමට ලක්වූ ප්‍රජාවන්ගේ අයිතීන් ප්‍රවර්ධනය කිරීම;

e) ආබාධිතතා අයිතීන් සුරක්ෂිත කිරීම - ආබාධිතතා සහිත පුද්ගලයින් සඳහා තොරතුරු සහ පහසුකම්වල ප්‍රවේශය, ඔවුන්ගේ අයිතීන් පිළිබඳ දැනුවත්භාවය, ජීවනෝපායය පුහුණු සහ සහාය;

f) ප්‍රජාව සහ මහජන ජිවිතය තුළ නායකත්වය සහ සහභාගිත්වය ශක්තිමත් කිරීමට තරුණ ප්‍රජාවට අවස්ථා ලබාදීම.

**වැඩසටහන් ක්ෂේත්‍රය 4 : දැනට පවතින සහ මතුවන ගැටළු ආමන්ත්‍රණය කිරීමට සිවිල් සමාජ සංවිධානවල හැකියාව ශක්තිමත් කිරීම**

a) සිවිල් සමාජ සංවිධාන හෝ තනි ක්‍රියාකාරීන් (විශේෂයෙන් කාන්තා ක්‍රියාකාරීන්) හට විවිද වූ සැපයුම් යාන්ත්‍රන (නිදසුන් ලෙස, මහජන කතිකාව, පර්යේෂණ, පුහුණු සහ ජාලකරණය) නිරාවරණය වීමට අවස්ථා ලබාදීමෙන් ප්‍රජාව සමග ඵලදායී ගණුදෙනුවකට සහයෝගය දැක්වීම;

b) ස්ත්‍රී පුරුෂ සමාජභාවය, ජනවාර්ගිකත්වය සහ සුළුතර ආගමික කණ්ඩායම් පිළිබඳව කටයුතු කරන සංවිධානවලට අන්තර් ආංශිකතාවය වඩාත් හොඳින් ආමන්ත්‍රණය කිරීමට ඒවා ශක්තිමත් කිරීම;

c) අවශ්‍යතා සහ හිදැස් ආමන්ත්‍රණය කිරීම සඳහා ඉහත සඳහන් ඕනෑම වැඩසටහන් ක්ෂේත්‍රයන් ආමන්ත්‍රණය කරන ද්‍රව්‍ය ප්‍රකාශයට පත්කිරීම, පරිවර්තනය කිරීම සහ ප්‍රචාරණය කිරීම (මේවා සිංහල, ද්‍රවිඩ හෝ ඉංග්‍රීසියෙන්/මෙම භාෂාවලට, විය හැක).

## යෝග්‍යතා නිර්ණායක

ඉහත සඳහන් තේමාත්මක වැඩසටහන් ක්ෂේත්‍රවලට අනුකූල වන ව්‍යාපෘති යෝජනා ඉදිරිපත් කරන ලෙස විභවයක් පවතින අයැදුම්කරුවන් හට ආරාධනා කෙරේ. ව්‍යාපෘති භූගෝලීය බාධක නොමැතිව, ශ්‍රී ලංකාවේ ඕනෑම පෙදෙසක ක්‍රියාත්මක කළ හැක; උපමය-මූල්‍යාධාර ලබාදීම් සඳහා අවසර ලබා නොදේ; අයැදුම්කරුවන් ඔවුන් විසින් යෝජිත ක්‍රියාකාරකම් ක්‍රියාත්මක කරන බව සහ තුන්වන පාර්ශවයකට උප-කොන්ත්‍රාත් කිරීම හෝ උපමය-මූල්‍යාධාර ලබාදීමක් නොකරන බව විදහා දැක්විය යුතුය (ව්‍යතිරේකයන් වනුයේ, සමහර ක්‍රියාකාරකම් සඳහා උප-කොන්ත්‍රාත් කිරීමට සිදුවිය හැකි සම්පත් දායකයින් හෝ උපදේශකයින් හෝ තෙවන පාර්ශව විශේෂඥයින් ය).

එක් සංවිධානයකින් එක් අයැදුම්පතක් පමණක් භාරගනු ඇත (තනිව හෝ වෙනත් සංවිධාන එකක්/කිහිපයක් සමග හවුල්කාරිත්වයෙන් අයැදුම් කරන).

- යෝග්‍ය ප්‍රදානලාභීන්ට, ලියාපදිංචි වී ඇති ප්‍රජා මූල සංවිධාන, දේශීය රාජ්‍ය නොවන සංවිධාන, සහ දේශීය ලාභ නොලබන සංවිධාන ඇතුළත් වේ.
- තනි පුද්ගලයින්ගෙන් අයැදුම්පත් භාරගනු නොලැබේ.
- වලංගු ලියාපදිංචි වීමක් නොමැති සංවිධාන සළකා බලනු නොලැබේ. (ව්‍යතිරේකයක් ලෙස, අයැදුම්කරු, වලංගු ලියාපදිංචි වීමක් සහිත පහසුකරණ සංවිධානයක් සමග හවුල්කාරිත්වයෙන් අයැදුම් කරන්නේ නම්,

එවැනි අයැදුම්පත් සළකා බලනු ඇත). පහසුකරණ සංවිධාන මෙම කැඳවීමේ සියළු යෝග්‍යතා නිර්ණායක වලට අනුකූල විය යුතුය.

- NTT සමග දැනට මූල්‍යාධාර ප්‍රදානයන් පවතින අයැදුම්කරුවන්ට අයැදුම් කළ හැකි නමුත්, අයැදුම්පත සළකා බලනුයේ පවතින ප්‍රදානය සතුටුදායක ලෙස නිම කිරීමෙන් පසුවය.
- NTT වෙතින් හෝ වෙනත් යම් මූල්‍යාධාර ප්‍රදායකයින් වෙතින් හෝ මූල්‍යාධාර ලබාගෙන ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීමේදී යහපත් කාර්ය සාධනයක් නොපෙන්වූ සංවිධාන වලට NTT විසින් මූල්‍යාධාර සපයනු නොලැබේ.
- රාජ්‍ය ආයතන හෝ දෙපාර්තමේන්තු වලින් ලැබෙන අයැදුම්පත් NTT විසින් සැළකිල්ලට නොගනු ඇත. NTT විසින් දේශපාලනික බැඳීම් සහිත සංවිධාන වෙත මූල්‍යාධාර සපයනු නොලැබේ.

## මූල්‍යාධාර ප්‍රමාණය සහ ව්‍යාපෘති කාලසීමාව

ඉල්ලුම් කළ හැකි අවම ප්‍රමාණය රුපියල් 1,000,000 ක් වන අතර, උපරිමය රුපියල් 5,000,000 ඉක්ම විය නොහැක. ප්‍රදානයේ අවම කාල සීමාව මාස 12 ක් සහ උපරිමය මාස 24 ක් වේ. සුවිශේෂී තත්ත්වයන් යටතේ උපරිම ප්‍රමාණය සහ/හෝ ප්‍රදානයේ කාලසීමාව ඉක්මවා යන ඉල්ලීම් සළකා බැලීමේ අයිතිය NTT සතුය. රුපියල් 3,000,000 සිට 5,000,000 දක්වා ඉල්ලුම් කරන අයැදුම් පත් සඳහා මුලින් *සංකල්ප පත්‍රිකාව* පමණක් *ඉදිරිපත් කළ යුතුය.*

## අයැදුම් පත් සඳහා උපදෙස් සහ භාරගැනීම් සඳහා නියමිත කාලය

අයැදුම් පත් සිංහල, දෙමළ හෝ ඉංග්‍රීසි භාෂාවෙන් ඉදිරිපත් කළ හැකි අතර, යතුරු ලියනය කර තිබිය යුතුය. ව්‍යාපෘති සුදුසුම අන්දමින් 2018 මාර්තු මස හෝ ඉන් පසුව ආරම්භ කළ යුතු වේ. අයැදුම් පත් NTT ආකෘතිය භාවිතා කර පමණක් ඉදිරිපත් කළ යුතු අතර, වෙනත් ආකෘති වලින් ඉදිරිපත් කරන අයැදුම් පත් ප්‍රතික්ෂේප කරනු ඇත.

අයැදුම් පත් නිසියාකාරව සම්පූර්ණ කර, අදාළ අයැදුම් පත් ආකෘතියෙහි සඳහන් කර ඇති සියළු උපකාරක ලියකියවිලි ඇතුළත් කළ යුතුය. අසම්පූර්ණ අයැදුම් පත් (අවශ්‍ය කරන උපකාරක ලියකියවිලි නොමැතිව) සළකා බලනු නොලැබේ.

සියළු අයැදුම්පත්: grant.applications@neelan.org වෙත එවිය යුතුය. (කරුණාකර විෂය යටතේ **NTT/NOV/2017/02** ***අයැදුම්කරුගේ නම*** සඳහන් කරන්න).
තැපෑලෙන්, අධිවේග තැපෑලෙන් හෝ අතින් භාරදෙන අයැදුම් පත් යොමුකළ යුත්තේ, ව්‍යාපෘති කළමනාකරු, නීලන් තිරුචෙල්වම් ට්‍රස්ට්, (NTT), 16/6A, වෝඩ් පෙදෙස, (මොහිදීන් ටෙරසය), කොළඹ 7 යන ලිපිනයටය. කවරයෙහි පිටත **NTT/NOV/2017/02** ***අයැදුම්කරුගේ නම*** පැහැදිළිව සඳහන් කළ යුතුය.

**විද්‍යුත් තැපෑල සහ දෘඪ පිටපත (HARD COPY) යන දෙකින්ම අයැදුම් පත් නොඑවා, කරුණාකර ඉන් එක් ක්‍රමයක් පමණක් භාවිතා කරන්න.**

**රු. 3,000,000 දක්වා අයැදුම් පත්:**

- ඉදිරිපත් කිරීමට නියමිත අවසාන දිනය : **2018 ජනවාරි 2,** දේශීය වේලාවෙන් පැය 16:00 ට පෙර.
- අයැදුම් පත් : http://neelan.org/download-forms/ වෙතින් බා ගත හැක.
- මෙම ව්‍යාපෘති යෝජනා කැඳවීමට අදාළ යම් ප්‍රශ්න වෙතොත් ඒවා ලිඛිතව විද්‍යුත් තැපෑලෙන් grant.applications@neelan.org වෙත 2017 දෙසැම්බර් 5 වෙනි දින හෝ ඊට පෙර යොමු කළ යුතුය. දුරකථන විමසුම් සළකා බලනු නොලැබේ.

**රුපියල් 3,000,000 - 5,000,000 අතර අයැදුම්පත් සඳහා: සංකල්ප පත්‍රිකා පමණි.**

- ඉදිරිපත් කිරීමට නියමිත අවසාන දිනය: **2017 දෙසැම්බර් 20** වැනි දින දේශීය වේලාවෙන් පැය 16:00 ට පෙර.
- අයැදුම් පත්: http://neelan.org/download-forms/ වෙතින් බා ගත හැක. (කෙටි ලැයිස්තුවට ඇතුළත් වන අයැදුම්කරුවන් හට පමණක් සම්පූර්ණ ව්‍යාපෘති යෝජනාව ඉදිරිපත් කරන ලෙස ඉල්ලුම් කරනු ඇත).
- මෙම ව්‍යාපෘති යෝජනා කැඳවීමට අදාළ යම් ප්‍රශ්න වෙතොත් ඒවා ලිඛිතව විද්‍යුත් තැපෑලෙන් grant.applications@neelan.org වෙත 2017 දෙසැම්බර් 5 වෙනි දින හෝ ඊට පෙර යොමු කළ යුතුය. දුරකථන විමසුම් සළකා බලනු නොලැබේ.

කරුණාකර ඉදිරිපත් කළ අයැදුම්පත් සම්බන්ධව NTT කාර්ය මණ්ඩලය ඇමතීමෙන් වළකින්න.

**NTT වැඩසටහනේ කමිටුව විසින් ගන්නා තීරණ අවසාන තීරණ වේ.**